# 9 . දත්ත සමුදාය

## 9.0 තොරතුරු ලබා ගැනීම සඳහා සරල දත්ත සමුදාය නිර්මාණය

### ශිෂ්‍ය කාර්යය -

- ඔබගේ පෙළ පොතෙහි පිටු අංක 263 සිට 288 දක්වා පාඩම කියවා ලබා දී ඇති උදාහරණ ඇසුරින් අධ්‍යනය කරන්න.
- මෙහි දක්වා ඇති මාර්ග ගත ඉගෙනුම් ආධාරක මඟින් මෙම පාඩම තවදුරටත් අධ්‍යනයේ යෙදෙන්න.
- අමාරු /අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකුගෙන් හෝ ගුරුවරයෙකුගෙන් අසා දැන ගන්න.
- පෙළ පොතෙහි පිටු අංක 278 හි ක්‍රියාකාරකම කරන්න.

### මෙම පාඩමට අදාළව උපකාර ගත හැකි ඉගෙනුම් ආධාරක-

ඉ තක්සලාව- https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=563#section-9

e-නැණ පියස - https://www.enenapiyasa.lk/lms/course/view.php?id=453

වෙනත් - https://youtu.be/SexNteh-oQY

සවියෙන් පෙරට - e -ඉගෙනුම් පාසල හොරණ අධ්‍යාපන කලාපය- https://drive.google.com/file/d/1W-FSfJbfmyEVacLBVBmWExJWU32d1Ju9/view

### මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල-

- සරල සම්බන්ධිත දත්ත සමුදා සැලසුම් කරයි.
- ප්‍රාථමික හා ආගන්තුක යතුරු හඳුනා ගනියි
- වගු අතර සම්බන්ධතා ගොඩ නඟයි.

### ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය

පහතින් දැක්වෙන්නේ අධ්‍යාපන ආයතනයක දත්ත සමුදාය වගු කිහිපයකි.මෙහි පාඨමාලා රැසක් පැවැත්වෙන අතර එක් ශිෂ්‍යයෙකුට පාඨමාලා කිහිපයකට සම්බන්ධ විය හැක.

| Student_ID | Name | Birthday | City | Course_Code |
|---|---|---|---|---|
| 1001 | Umesha | 22/09/1998 | Kegalle | DIGD |
| 1002 | Thilina | 03/01/1999 | Rathnapura | DISE |
| 1003 | Milan | 15/12/1998 | Polonnaruwa | DISE |
| 1004 | Samanka | 19/04/1997 | Galle | DICA |

ශිෂ්‍ය වගුව

| Course_Code | Course_Name | Course_Fee(Rs) |
|---|---|---|
| DICA | Diploma In Computer Application | 30000 |
| DIGD | Diploma In Graphic Designing | 45000 |
| DISE | Diploma In Spoken English | 50000 |

පාඨමාලා වගුව

| Student_ID | Course_Code | Marks | grade |
|---|---|---|---|
| 1001 | DIGD | 50 | C |
| 1002 | DISE | 80 | A |
| 1003 | DISE | 70 | B |
| 1004 | DICA | 75 | A |

ශිෂ්‍ය ලකුණු වගුව

(i) එක් එක් වගුව සඳහා ප්‍රාථමික යතුරක් බැගින් යෝජනාකරන්න

(ii) මෙම වගු අතර දක්නට ලැබෙන ආගන්තුක යතුරක් අදාල වගුවේ නමද සහිතව ලියා දක්වන්න

(iii) වගු අතර දක්නට ලැබෙන සම්බන්ධතා මොනවාද?

(iv) කසුන් නමින් නවක ශිෂ්‍යයෙක් ඉංග්‍රීසි පාඨමාලාවට ඇතුළත් වූයේ නම් යාවත්කාලින කළ යුතු වගුව / වගු අදාල රෙකෝඩ සමඟ ලියා දක්වන්න.